# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2181/19 – 2020 ජූනි 24 වැනි බදාදා – 2020.06.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 2084/06 හා 2018.08.14 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 2018 අංක 193 හා 2018.06.20 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් එම ඉඩම් කොටසේ භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 2084/06 හා 2018.08.14 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2018 අංක 193 හා 2018.06.20 වැනි දින දරන ආඥාව මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2017/VE/469.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: MUL/LND/2/ACQ/95.
2020 මාර්තු මස 12 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දබඩ පත්තුව සුළු කොට්ඨාසයේ, දිද්දෙනිපොත (අ.ග.පි. 130) ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක MR/MLT/2017/626 හා 2017.12.27 දිනැති ප්‍රගමන අනුරේඛනයේ දක්වෙන පහත නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – ඇටකෙහෙල්වරාව – ප්‍රමාණය: හෙක්. 0.9309ක් පමණ**

උතුරට: වියළි ඇළ සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාව හිමිකම් කියන ඇටකෙහෙල්වරාව; නැගෙනහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාව හිමිකම් කියන ඇටකෙහෙල්වරාව, වියළි ඇළ සහ මාර්ගය (ප්‍රා.ස.); දකුණට: වියළි ඇළ, මාර්ග (ප්‍රා.ස.) සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාව හිමිකම් කියන ඇටකෙහෙල්වරාව; බටහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාව හිමිකම් කියන ඇටකෙහෙල්වරාව සහ වියළි ඇළ.

07 - 275

1A – G32391 – 21 (2020/06)      ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*